PAFFREL
නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය.
சுதந்திரமானதும் நியாயமானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.
PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS

ගරු ආචාර්ය ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා,
ගරු අමාත්‍ය,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
2025.07.28

ගරු අමාත්‍යතුමනි,

**<u>පළාත් සභා මැතිවරණ කඩිනමින් පැවැත්වීම.</u>**

බලයේ සිටින දේශපාලන පක්ෂයේ අවශ්‍යතාවය මත පළාත් සභා මැතිවරණ ප්‍රමාද කිරීම, කඩින් කඩ පැවැත්වීම පසුගිය බොහොමයක් රජයන් තම ජයග්‍රහණය සඳහා උපක්‍රමයක් ලෙස භාවිත කිරීම දිගින් දිගටම දක්නට ලැබුණු කරුණකි. යහපාලන ආණ්ඩු කාලය තුළ එනම් 2017 අංක 17 දරණ පළාත් පාලන සභා ඡන්ද විමසීමේ සංශෝධන පනත හරහා පළාත් සභා මැතිවරණ ක්‍රමය සංශෝධනය කිරීමත් එයට අදාල නීතිමය තත්ත්වයන්/සීමා නීර්ණ කටයුතු අවසන් නොකිරීමත් මත, පළාත් සභා මැතිවරණ අතරමං කර දමා ඇත.

මේ වන විට පළාත් සභා මැතිවරණය වසර 11කට වැඩි කාලයක් පැවැත්වීමට අප අපොහොසත් වී ඇත. එය අවසන් වරට පවත්වා ඇත්තේ 2014.09.20 දින ඌව පළාත් සභාව සඳහා වන අතර එය වසර 11 කට පෙරාතුවය. ඒ අනුව බොහෝමයක් පළාත් සභා වසර 6ක පමණ කාලයක් සිට මහජන නියෝජිතයන්ගෙන් තොරව පාලනය වේ, එය යහපත් ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණයක් නොවේ. ඒ සඳහා වත්මන් රජය වගකිව යුතු නොවූවද, මැතිවරණ පැවැත්වීමට ඇති බාධා ඉවත් කර මැතිවරණ පැවැත්වීමට කටයුතු කිරීම රජයේ වගකීමක් බව අප අවධාරණය කරමු.

මේ කාලය තුළ මැතිවරණ පැවැත්වීමට අවශ්‍ය නීති සංශෝධනය සඳහා පෞද්ගලික මන්ත්‍රී යෝජනා දෙකක් ඉදිරිපත් වී ඇති අතර විශය භාර අමාත්‍යවරයා ලෙස ඒ පිළිබඳව සොයා බලා අවශ්‍ය නීතිමය සංශෝධන සිදුකර එළඹෙන වර්ෂයේ මුල් කාර්තුව තුළ හෝ මැතිවරණ පැවැත්වීමට කටයුතු කරන ලෙස අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිමු.

පළාත් සභා ක්‍රමය පිළිබඳව හෝ පළාත් සභා මැතිවරණ ක්‍රමය පිළිබඳව ගැටලුවක් වේ නම් එය ඉදිරි කාලය තුළ සාකච්ඡා කර තීරණය කළ හැකි අතර, කඩිනමින් මැතිවරණ පැවැත්වීම සඳහා පැරණි ක්‍රමයට මැතිවරණ පැවැත්වීමට කෙටි නීති සංශෝධනයක් සුදුසු බවද වැඩිදුරටත් යෝජනා කරමි. එමෙන්ම පැරණි ක්‍රමයට මැතිවරණ පැවැත්වීම සඳහා කෙටිකාලීන නීති සංශෝධනයක් ගෙන එන්නේ නම් කාන්තා නියෝජනය තහවුරු කිරීම සඳහා නාමයෝජනා වලින් 25% හෝ ප්‍රතිශතයක් වෙන් කිරීමද ඊට ඇතුළත් කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

මෙයට,
විශ්වාසී,

රෝහණ හෙට්ටිආරච්චි
විධායක අධ්‍යක්ෂ

#No.16, Byrde Place, Off Pamankada Rd, Colombo 06.
Tel : (+94) 11 2558570 / 11 2558571 Fax : (+94) 11 2558572
Email : paffrel@sltnet.lk Web : www.paffrel.com